# දකුණු පළාත් සභාවේ 1990 අංක: 1 දරණ ක්‍රීඩා ප්‍රඥප්තිය.

පළාත් ක්‍රීඩා සභාවක්, දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු, ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු පිහිටුවීම සඳහා ද, ක්‍රීඩා අරමුදලක් ඇති කිරීම සඳහා ද, ක්‍රීඩා සංවිධාන ලියාපදිංචි කිරීම හා පරිපාලනය, ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානය සහ ක්‍රීඩාංගන සම්පාදනය සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජන රජයේ දකුණු පළාත් සභාව මෙසේ පනවනු ලැබේ:-

1. මේ ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ දකුණු පළාත් සභාවේ 1990 අංක: 1 දරණ ක්‍රීඩා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ ලුහුඬු නාමය
අනුමැතිය ලැබුණු දිනයක ක්‍රියාත්මක විය යුතුය.

2. මේ ප්‍රඥප්තියෙහි දක්වා ඇති කාර්යයන් සඳහා මතු දැක්වෙන විධිවිධාන වලට අනුකූලව :-

(අ) පළාත් ක්‍රීඩා සභාවක්,
(ආ) දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු තුනක්, ක්‍රීඩා සභාවක්
(ඇ) අමාත්‍ය වරයා විසින් නියම කරනු ලැබිය හැකි ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු සංඛ්‍යාවක්, ආදිය පිහිටුවීම.
(ඈ) පළාත් ක්‍රීඩා අර මුදල යනුවෙන් අරමුදලක්
(ඉ) ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානයක්,
(ඊ) අමාත්‍ය වරයා විසින් නිශ්චය කරනුලැබිය හැකි ක්‍රීඩාංගන සංඛ්‍යාවක් පිහිටුවනු ලැබිය හැකිය.

3. 1. ක්‍රීඩා අධ්‍යක්ෂ වරයෙකු පත් කරනු ලැබිය යුතුය. ක්‍රීඩා ක්‍රීඩා අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ වරයා විසින් ඔහු වෙත මෙම ප්‍රඥප්තිය යටතේ අමාත්‍ය වරයා සහ වෙනත්
විසින් පවරනු ලබන කාර්යයන් සහ රාජකාරි යථා පරිදි ඉටු කිරීම නිලධරයන් පත් කිරීම.
සම්බන්ධයෙන් ඔහු වගකිව යුතුය.

2. එක් සහකාර අධ්‍යක්ෂ වරයෙකු හෝ ඊට වැඩි ගණනක් සහ මෙම පණත යටතේ කාර්යයන් සඳහා කලින් කල අවශ්‍ය විය හැකි වෙනත් නිලධාරීන් පත් කරනු ලැබිය හැකිය.

3. මේ වගන්තියේ (1) වන හා (2) වන උප වගන්ති යටතේ පත්කරනු ලබන සියලු නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතුය.

4. මෙම ප්‍රඥප්තිය යටතේ ක්‍රියා කරන යම් රාජ්‍ය නිලධාරියෙකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ නොකරන ලද යම් දෙයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු නඩුවක් නොවිය යුතුය.

....| 2.

5 මේ වගන්තිය යටතේ පත් කරන ලද සියළු නිලධරයන් විසින් තම බලතල ක්‍රියාත්මක කිරීමේදී තම කාර්‍යයන් සහ රාජකාරි ඉටු කිරීමේදී අමාත්‍ය වරයා විසින් හෝ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරනු ලබන පොදු හෝ විශේෂ විධි විධාන වලට අනුකූලව ක්‍රියා කළ යුතුය.

## 1 වන කොටස

### දකුණු පළාතේ ක්‍රීඩා සභාවක්, දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු හා ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු පිහිටුවීම.

4. (1) දකුණු පළාතේ ක්‍රීඩා ශාරීරික අධ්‍යාපන සහ විනෝද ක්‍රීඩා දියුණු කිරීම, සංවිධානය කිරීම හා ධෛර්‍යමත් කිරීම පිළිබඳ කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය වරයාට උපදෙස්දීම සඳහා මින්මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන "දකුණු පළාත් ක්‍රීඩා සභාව" යනුවෙන් සඳහන් වනු ලබන සභාවක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) ඒ සභාව,

(අ) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ

(ආ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

(ඇ) පළාත් තරුණ සේවා අධ්‍යක්ෂ

(ඈ) පළාත් පාලන පළාත් අධ්‍යක්ෂ

(ඉ) පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ

(ඊ) අමාත්‍ය වරයා විසින් පත් කරනු ලද සභාපති කෙනෙකු සහ වෙනත් සාමාජිකයන් දහ දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

දකුණු පළාතේ ක්‍රීඩා සභාව පිහිටුවීම

(3) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ ලේකම් වශයෙන් කටයුතු කළ යුතුය.

(4) සභාවේ ක්‍රියාකාරිත්වය සහ කාර්යයන් සහ රැස්වීම සඳහා ගණපූරණය අමාත්‍ය වරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය.

(5) සභාවේ රැස්වීම් වල කාර්‍ය පරිපාටිය සහ ඒ රැස්වීම් වල කටයුතු විධිමත් කිරීම සඳහා සභාව විසින් රීති සෑදිය හැකිය.

5. (අ) අමාත්‍ය වරයා විසින් පත් කරනු ලැබූ සභාවේ සභාපති හෝ සාමාජිකයන් මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන්, හෝ ඉවත් කරනු ලැබීමෙන්, කලින් ධූරය හිස් වුවහොත් මිස තුන් අවුරුදු කාල සීමාවක් දැරිය යුතුය.

(ආ) අමාත්‍ය වරයා විසින් පත් කරනු ලැබූ සභාවේ සභාපති හෝ යම් සාමාජිකයෙකු ධූරයෙන් ඉවත් කිරීම, අවශ්‍යතාවෙන්ම බව අමාත්‍ය වරයා විසින් සළකතහොත් හේතු නොදක්වා ඔහු විසින් එසේ කළ හැකි අතර, ඒ ඉවත් කිරීම යම් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

සභාවේ සාමාජිකයන්ගේ ධූරය හිස්වම ඔවුන් ඉවත් කිරීම් ආදිය

...3

(ඇ) මිය යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් සභාපතිගේ හෝ සාමාජිකයෙකුගේ ධුරය හිස් වූ විට එසේ හිස් වූ ධුරය දැරූ තැනැත්තා වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තෙකු හිස් වූ ධුරය දැරූ තැනැත්තාගේ ධුර කාලයෙන් ඉත නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතුය.

6. යම් තැනැත්තෙකු

**නුසුදුසුකම්**

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තෙකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් හෝ

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තෙකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් හෝ

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කිසිවක් තැනීමෙන් කොටස් එක්තර සෑදීමෙන් , විකිණීමෙන් හෝ නිෂ්පාදනය කිරීමෙහිලා කෙළින්ම හෝ අන් අයුරකින් සම්බන්ධතාව දරතහොත් හෝ

(ඈ) චරිත දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයේදී වරදකරු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා සභාවේ සේවය කිරීමට නුසුදුසු විය යුතුය.

7. කාලය ඉකුත්වීමෙන් ධුරය හිස් කරන සාමාජිකයෙකු නැවත පත් කිරීමට සුදුසු විය යුතුය.

**නැවත පත් කරනු ලැබීමට සාමාජිකයෙකු සුදුසු බව.**

8. අමාත්‍ය වරයා විසින් පත් කරන ලද යම් සාමාජිකයෙකු අසනීපවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ ඔහුගේ ධුරයේ යුතුකම් ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වුවහොත් සාමාජිකයෙකු වශයෙන් ඔහු වෙනුවෙන් වැඩ බැලීමට අමාත්‍ය වරයා විසින් අන්කිසි තැනැත්තෙකු නියමිත කාල සීමාවකට පත් කරනු ලැබිය හැකිය.

**වැඩ බලන සාමාජිකයන් පත් කිරීම.**

9. (1) ඒ ඒ දිස්ත්‍රික්කයේ ක්‍රීඩා ශාරීරික අධ්‍යාපනය සහ විනෝද ක්‍රීඩා දියුණු කිරීමට, සංවර්ධනය කිරීමට සහ ධෛර්ය දීමට දකුණු පළාතේ එක් එක් පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා " දිස්ත්‍රික් ක්‍රීඩාකමිටුවක් " අමාත්‍ය වරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

(2) දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු :-

**දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු පිහිටුවීම.**

(අ) දිස්ත්‍රික්කයේ රජයේ ඒජන්ත
((ආ) දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි
(ඇ) අධ්‍යාපන අධ්‍යක්ෂ
(ඈ) දිස්ත්‍රික් ශාරීරික අධ්‍යාපන නිලධාරි
(ඉ) දිස්ත්‍රික් භාර කරුණ සේවා නිලධාරි සහ
(ඊ) අමාත්‍ය වරයා විසින් පත් කරන ලද නියෝජිතයන් 12 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

...| 4.

(3) පරිපාලන දිස්ත්‍රික්කයෙහි රජයේ ඒජන්ත සභාපති විය යුතුය.

(4) දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි ලේකම් විය යුතුය.

10. මේ ප්‍රඥප්තියෙහි විධිවිධාන වලට යටත්ව දිස්ත්‍රික් ක්‍රීඩා කමිටු වල ක්‍රියාකාරිත්වය, කාර්යයන් හා කමිටුවල රැස්වීම්වල ගණපූරණය නියෝගයන් මගින් නියම කරනු ලැබිය යුතුය. — දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල ද

11. සෑම දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක් විසින් ඒ ඒ කමිටුවේ රැස්වීම්වල කාර්ය පටිපාටිය හා ඒ රැස්වීම්වල කටයුතු විධිමත් කිරීම සඳහා නීති රීති සෑදිය හැකිය.

12. (1) අමාත්‍ය වරයා විසින් පත් කරනු ලබන යම් දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවක් සාමාජිකයින් මිය යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් වුවහොත් මිස තුන් අවුරුදු කාල සීමාවක් දැරිය යුතුය. — සාමාජිකයන්ගෙ ධුරය හිස්වීම

(2) දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවකට අමාත්‍ය වරයා විසින් පත් කරනු ලබන යම් සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍යාවෝචිත බව අමාත්‍ය වරයා විසින් සලකතහොත් හේතු නොදක්වා ඔහු විසින් එසේ කළ හැකි අතර, ඒ ඉවත් කිරීම යම් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

(3) මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරය හිස්වන යම් සමාජිකයෙකු වෙනුවට පත්කරනු ලබන යම් තැනැත්තෙකු එසේ හිස්වූ ධුරය දැරූ සාමාජිකයන්ගේ ධුර කාලයෙන් ගත නොවී ඇති කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතුය.

13. කාලය ඉකුත් වීමෙන් ධුරය හිස් කරන සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතුය. — සාමාජිකයා නැව පත් කිරීම.

14. අසනීපය නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනයම් හේතුවක් නිසා හෝ තම ධුරයේ යුතුකම් ඉටු කිරීමට යම් සාමාජිකයෙකු තාවකාලිකව අපොහොසත් වුවහොත් ඔහු වෙනුවෙන් සාමාජිකයෙකු වශයෙන් වැඩ බැලීමට අන් කිසි තැනැත්තෙකු අමාත්‍ය වරයා විසින් පත් කරනු ලැබිය හැකිය. — වැඩ බලන සාමපිකයන්

15. යම් තැනැත්තෙකු:-

(අ) නීති බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තෙකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් හෝ

(ආ) නීති බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොලොත් තැනැත්තෙකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් හෝ,

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කොටස් තැනීමෙන් කිසිවක් එක්කර සැදීමෙන්, විකිණීමෙන් හෝ නිෂ්පාදනය කිරීමෙහිලා කෙළින්ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවයක් දරතහොත් හෝ,

දිස්ත්‍රික් ක්‍රීඩා කමිටුවල සාමාජික යන් වශයෙන් සේවය කිරීම සඳහා නුසුදුසුකම්.

(ඈ) චරිත දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයකදී, වරදකරු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා සභාවේ සේවය කිරීමට නුසුදුසු විය යුතුය.

16. (1) ඒ ඒ ප්‍රාදේශීය සහ බල ප්‍රදේශ තුළ ශාරීරික අධ්‍යාපන සහ විනෝද ක්‍රීඩා දියුණු කිරීමට අදාළ කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සහ උදව් දීම පිණිස අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි දකුණු පළාතේ එක් එක් ප්‍රාදේශීය සහ බල ප්‍රදේශ සඳහා "ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු " සුදුසු ආකාරයේ නිවේදනයක් මගින් ඔහු විසින් පිහිටුවනු ලැබිය හැකිය.

(2) ප්‍රාදේශීය ක්‍රීඩා කමිටු:-
(අ) ප්‍රාදේශීය ලේකම්
(ආ) ක්‍රීඩා නිලධාරී
(ඇ) කලාපීය අධ්‍යාපන නිලධාරීන්
(ඈ) මණ්ඩලීය අධ්‍යාපන නිලධාරීන්
(ඉ) තරුණ සේවා නිලධාරීන්
(ඊ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නියෝජිතයින් 25 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

(3) ප්‍රාදේශීය ලේකම් සභාපති වනු ඇත.
(4) ක්‍රීඩා නිලධාරී ලේකම් වනු ඇත.

17. සභාවේ ක්‍රියාකාරීත්වය සහ කාර්යයන් සහ සභාවේ රැස්වීම් සඳහා ගණපූරණය මෙම පණතේ විධිවිධාන වලට යටත්ව අමාත්‍යවරයාගේ නියෝග මගින් නියම කරනු ලැබිය යුතුය. ක්‍රීඩා කමිටු රීති

18. සභාවේ රැස්වීම්වල කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම් වල කටයුතු විධිමත් කිරීම සඳහා සභාව විසින් රීති සෑදිය හැකි ය.

19. අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සභාවේ සභාපති හෝ ලේකම් හෝ සාමාජිකයින් මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් වුවහොත් මිය තුන් අවුරුදු කාල සීමාවක් ධුරය දැරිය යුතුය.

සාමාජිකයින්ගේ ධුරය හිස්වීම

20. (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍යතාවයක් බව අමාත්‍යවරයා සලකතහොත් හේතු නොදක්වා ඔහු විසින් එසේ කළ හැකි අතර, ඒ ඉවත් කිරීම යම් අධිකරණයකදී ප්‍රශ්න නොකළ යුතුය.

.../6-

(2) මිය යාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හෝ සාමාජිකයෙකුගේ ධූරය හිස් වූ විට, එසේ හිස් වූ ධූරය දැරූ තැනැත්තා වෙනුවට පත් කරනු ලබන යම් තැනැත්තෙකු හිස් වූ ධූරය දැරූ තැනැත්තාගේ ධූර කාලයෙන් ගත නොවී ඇති කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

21. කාලය ඉකුත් වීමෙන් ධූරය හිස් කරන සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතුය.

22. අමාත්‍යවරයා විසින් පත් කරන ලද යම් සාමාජිකයෙකු අසනීපවීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනයම් හේතුවක් නිසා ඔහුගේ ධූරයේ යුතුකම් ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වුවහොත් සාමාජිකයෙකු වශයෙන් ඔහු වෙනුවෙන් වැඩ බැලීමට අමාත්‍යවරයා විසින් යම්කිසි තැනැත්තෙකු පත් කරනු ලැබිය හැක.

23. යම් තැනැත්තෙකු :-

(අ) නිසි බලය ඇති අධිකරණයක් විසින් උමතු තැනැත්තෙකු ලෙස විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් හෝ,

(ආ) නිසි බලය ඇති අධිකරණයක් විසින් බුන්වත් හෝ බංකොළොත් තැනැත්තෙකු වශයෙන් විනිශ්චය කරනු ලැබුවහොත් හෝ විනිශ්චය කරනු ලැබ සිටියහොත් හෝ,

(ඇ) ක්‍රීඩා භාණ්ඩ, ක්‍රීඩා ආම්පන්න හෝ ක්‍රීඩා උපකරණ කොටස් තැනීමෙන් කිසිවක් එක්කර සෑදීමෙන්, විකිණීමෙන් හෝ නිෂ්පාදනය කිරීමෙහි ලා තෙළින්ම හෝ අන් අයුරකින් සම්බන්ධතාවයක් දරතහොත් හෝ ,

(ඈ) චරිත දූෂණාත්මක වූ යම් වරදකට අධිකරණයකදී වරදකරු කරනු ලැබුවහොත් ඒ තැනැත්තා සභාවේ සේවය කිරීමට නුසුදුසු විය යුතුය.

## II කොටස.

## පළාත් ක්‍රීඩා අරමුදල පිහිටුවීම සහ පරිපාලනය කිරීම.

24. දකුණු පළාතේ ක්‍රීඩා වලට ධෛර්‍ය දීම, ඒවා සංවර්ධනය කිරීම සඳහා මෙහි මතු ' අර මුදල ' යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ, පළාත් ක්‍රීඩා අර මුදල යනුවෙන් හඳින්වෙන්නා වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය.

(අ) දීමනාවක් වශයෙන් කලින්කල රජයෙන් සම්මත කරනු ලැබිය හැකි සියළු මුදල්

(ආ) යම් විදේශීය රටකින් ආධාර වශයෙන් ලැබෙන සියළු මුදල්

(ඇ) යම් තැනැත්තෙකු විසින් අරමුදලට කරන ලද පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලු මුදල්

(ඈ) අර මුදලේ කාර්යයන් සඳහා කලින්කල දකුණු පළාත් සභාව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල් සහ

(ඉ) වෙනත් යම් මාධ්‍යයකින් ලැබෙන මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

පළාත් ක්‍රීඩා අර මුදල පිහිටුවීම.

25. එසේ වුවද, යම් නිශ්චය කාර්යයන් සඳහා ප්‍රයෝජනයනටගත යුතු මේ කොන්දේසි පිට මේ වගන්තියේ (ඇ)(ඈ) හෝ (ඉ) ඡේද යටතේ මුදලක් ලැබුණ අවස්ථාවක ඒ මුදල් අර මුදලේ බැරට භාර ගැනීම සම්පූර්ණයෙන්ම අමාත්‍ය වරයාගේ අභිමතය අනුව විය යුතුය.

එසේම තවදුරටත් ප්‍රධාන හෝ පරිත්‍යාග කිරීම යොදා ගැනීමට හෝ යම්කිසි නිශ්චිත කාර්යයන් සඳහා භාරයක් වශයෙන් තබා ගැනීමට අමාත්‍ය වරයාගේ අභිමතය අනුව මුදල් භාර ගනු ලැබිය හැකි අතර, ඒ මුදල් අරමුදලට බැර නොකර වෙනමම තබා ගත හැකිය.

අර මුදලට කළයුතු ගෙවීම්.

26. යම් නිශ්චල හෝ චංචල දේපළ පරිත්‍යාගයන් මේ පණතේ කාර්යයන් සඳහා යෙදීම පිණිස දකුණු පළාත් සභාව වෙනුවෙන් අමාත්‍ය වරයා විසින් පිළිගනු ලැබිය හැකිය. එවැනි යම් දේපළක් අමාත්‍ය වරයාගේ අභිමතය පරිදි සහ ඔහු වෙනුවෙන් විනිශ්චය කරනු ලබන පරිදි යොදවා ලැබෙන මුදල් අරමුදලට බැර කරනු ලැබිය හැකිය.

චංචල හා නිශ්චල දේපොල පරිත්‍යාග

27. (1) අරමුදල අමාත්‍ය වරයාගේ පාලනය සහ පරිපාලනය යටතේ තිබිය යුතු අතර, එය අමාත්‍ය වරයාගේ විධාන වලට යටත්ව අමාත්‍යාංශයේ ලේකම් විසින් පරිශීලනය කළ යුතුය.

(2) එක් එක් ලිත් වර්ෂය සම්බන්ධයෙන් පරිපූර්ණ ලෙස හා උචිත ලෙස අරමුදලේ ගණන් හිලව් තබා ගෙන යාමට අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙල කළ යුතුය.

අර මුදලේ පරිපාලනය

(3) එක් එක් ලිත් වර්ෂය ඉකුත් වූ පසු හැකිතාක් ඉක්මණින් අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙල කළ යුතුය.

(4) 1971 අංක: 38 දරණ මුදල් පණතේ 2 කොටසේ විධි විධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අරමුදලේ මුදල් පාලනය හා ගණන් හිලව් සම්බන්ධයෙන් ඇතුල් විය යුතුය.

28. අමාත්‍ය වරයා විසින් හැකිතාක් ඉක්මණින් එක් එක් ලිත් වර්ෂය සඳහා වූ අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් එම අරමුදලේ විගණනය කරන ලද එම වර්ෂයේ ගිණුම්වල පිටපතක් ද, එම ගණන් පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව ද සමග දකුණු පළාත් සභාව හමුවේ තැබිය යුතුය.

.../ 8

29. අමාත්‍ය වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයන් :-

(අ) දකුණු පළාතේ යම් ක්‍රීඩාවකට ධෛර්ය දීම, එය දියුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා ද,

(ආ) ක්‍රීඩා විෂයෙහි ලබා දී ඇති යම් යම් ස්ථානයකට සැළකිලි වශයෙන් ක්‍රීඩා වලට දැනට සහභාගිවන්නන්ට හෝ ඉහත දී සහභාගිවූවන්ට කරුණා සහගත ගෙවීම් වශයෙන් ද,

(ඇ) යම් බැංකුවක ස්ථිර තැන්පත් ලෙස හෝ ආණ්ඩුවේ යම් ණය මුදලක හෝ ණයකර වල ආයෝජනය කිරීම සඳහා සහ

(ඈ) මේ පණතේ විධි විධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලගැන්වීමේ කාර්යයන් සඳහා ඔහු විසින් අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

## III කොටස

## ක්‍රීඩා සංවිධාන ලියාපදිංචි කිරීම සහ අනුපාලනය කිරීම.

30. පළාත් ක්‍රීඩා සංගමයක් පිහිටුවිය හැකි යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පංතියක් ගැසට් නිවේදනයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍ය වරයා විසින් නම් කරනු ලැබිය හැකිය.

ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පංතියක් නම් කිරීම.

31. 30 වැනි වගන්තිය යටතේ වූ නියමයක් මගින් යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පංතියක් නම් කරනු ලැබූ කල්හි, ඒ නියම කරනු ලැබූ අවස්ථාවේ ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා පංතිය පිළිබඳ පවත්නා වූ සෑම පළාත් සංගමයක් නියම කරනු හෝ නියම කරනු ලැබූ දිනයෙන් පසු පිහිටුවනු ලබන ඒ ක්‍රීඩාව හෝ ක්‍රීඩා පංතියක් පිළිබඳව පිහිටුවනු ලබන පළාත් ක්‍රීඩා සංගමයක් හෝ, ක්‍රීඩාවක හෝ ක්‍රීඩා පංතියක මේ පණතෙහි මින්මතු වන විධි විධාන වලට අනුකූලව පළාත් සංගම් ලියාපදිංචි කරන පිළිවෙළට ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කළ යුතුය.

පළාත් සං. ලියාපදිංචි කිරීම.

32. ලියාපදිංචි කිරීමට අදාළ යම් තීරණයකින් හෝ ක්‍රියාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තෙකු විසින් අමාත්‍ය වරයා වෙත අභියාචනය කළ හැකිය. ඒ අභියාචනය සම්බන්ධයෙන් අමාත්‍ය වරයාගේ තීරණය අවසාන හා තීරණාත්මක විය යුතුය.

ලියාපදිංචි කිරීමේ තරණ වලට විරුද්ධ අභියාචනා

33. අමාත්‍ය වරයා විසින් පහත සඳහන් කරුණු නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය.

(අ) ක්‍රීඩා සංවිධාන ලියාපදිංචි කිරීමේ කාර්ය පරිපාටිය සහ ඒවා ලියාපදිංචි කිරීම සඳහා අය කළ යුතු ගාස්තු,
(ආ) ක්‍රීඩා සංවිධාන වල සංයුතිය සහ සංස්ථාපනය
(ඇ) ඒ සංගම්වල යුතුකම්, බලය සහ කාර්ය පරිපාටිය සහ,
(ඈ) ඒ ක්‍රීඩා සංවිධාන වල තීරණවලට හෝ ක්‍රියාවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීමේ කාර්ය පරිපාටිය

පළාත් ක්‍රීඩා සංග... ලියාපදිංචි කිරීමේ කාර්ය පරිපාටිය හා ඒවායේ සංයුතිය යුතුකම්, බලතල හා කාර්යන් ආදිය.

34. (අ) සංගමයේ නිලධාරීන්ගේ දූෂණ, විෂමාචාර හෝ අක්‍රමිකතා යමක් සඳහා ප්‍රතිකර්ම යොදන ලෙස අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලිඛිත නිවේදනයක් මගින් දැනුම් දෙනු ලැබූ විට ඒ සම්බන්ධයෙන් නිවේදනයේ සඳහන්ව තිබිය හැකි කාලය තුළදී එසේ ප්‍රතිකර්ම යෙදීමට අපොහොසත්වීම හෝ ප්‍රතිකර්ම යෙදීම නොසළකා හැරීම නිසා හෝ,

ලි.ප. කිරීම ප්‍රතික්ෂේප කිරීම අත්හිටුවීම සහ වලංගු කිරීම.

(ආ) අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමෙහිලා අපර්මත්‍යව සිටීම, සංයෝගය බෙදීම හෝ අවහිර කිරීම නිසා හෝ,

(ඇ) ක්‍රීඩා සංවිධානයේ යුතුකම් හා කාර්යයන් ඉටු කිරීම පැහැර හැරීම නිසා ක්‍රීඩා සංවිධානයේ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ එහි ලියාපදිංචිය අත්හිටුවීම හෝ අවලංගු කිරීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය.

35. අත්හිටුවනු ලැබූ හෝ ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබීම නැතහොත් අවලංගු කරනු ලැබූ ක්‍රීඩා සංවිධානයක කාර්යයන් කර ගෙන යාම සඳහා අන්තර්කාලීන විධිවිධාන ක්‍රම අමාත්‍යවරයා විසින් ඇති කළ හැකිය.

අන්තර් කාලීන විධි විධාන.

36. (1) 31 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලීමක් නොකළහොත් හෝ, ලියාපදිංචි කිරීම 34 වැනි වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද හෝ අවලංගු කරන ලද යම් ක්‍රීඩා සංවිධානයක් විසුරුවා හරින ලෙස බල කරනු ලබන නියමයක් අමාත්‍යවරයා විසින් කළ හැකි අතර, එකී නියමයේ සඳහන් කර තිබූ කාලය තුළදී ඒ සංගමය විසුරුවා හැරීමට එහි කටයුතු අවසන් කිරීමට එම ක්‍රීඩා සංවිධානයේ නිලධාරීන් විසින් එකී නියමය පරිදි ක්‍රියා කළ යුතුය.

පළාත් ක්‍රීඩා සංගම් විසුරුවා හැරීම.

37. මේ ප්‍රඥප්තියෙහි විධිවිධාන වලට අනුකූලව ලියාපදිංචි නොකරන ලද යම් ක්‍රීඩාවක් හෝ ක්‍රීඩා පංතියක් පිළිබඳව පවත්නා වූ සංවිධානයක් මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ලැබිය හැකි යම් පහසුකම්, වරප්‍රසාද හෝ ආධාර ලැබීමට හිමිකම් නොලබනවා ඇත.

38. යම් ක්‍රීඩා සංවිධානයක් සම්බන්ධයෙන් කරන ලද විසුරුවා හැරීමේ නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම, අවස්ථාවෝචිත බව අමාත්‍යවරයා සළකනහොත්, එසේ ප්‍රත්‍යාදිෂ්ට කිරීම ද, යම් දූෂණ, විෂමාචාර හෝ අක්‍රමිකතා තිබේනම්, ඒවාට අමාත්‍යාංශ ලේකම්වරයා සුදුසු යයි නිගමනය කරන ප්‍රතිකර්ම යොදන ලෙස ද අමාත්‍යවරයා විසින් ඒ සංවිධානයේ සාමාජිකයන්ට නියම කළ හැකිය. ඉන්පසු තම අභිමතය අනුව අමාත්‍යවරයා විසින් ඒ සංවිධානයේ ලියාපදිංචි කිරීමට හෝ නැවත ලියාපදිංචි කිරීමට අවසර දිය හැකිය.

## IV කොටස.

## ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානයන් පිහිටුවීම.

39. අමාත්‍ය වරයා විසින් පහත සඳහන් කාර්‍යයන් සඳහා ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානයක් හෝ ප්‍රදානයන් පිහිටුවනු ලැබිය හැකිය. ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානය

(අ) ක්‍රීඩා ශාරීරික අධ්‍යාපනය හා විනෝද ක්‍රීඩා පිළිබඳ අවබෝධය හා උනන්දුව ඇති කිරීම.

(ආ) ක්‍රීඩා කුශලතාවය ඇති ළමයින්ගේ අවශ්‍යතා සම්පාදනය කිරීමෙන් දෙමවුපියන්ට ඇතිවන දුෂ්කරතා මග හැරවීම.

(ඇ) ක්‍රීඩා කුශලතා සොයා ගැනීම සහ එම කුසලතා වර්ධනය කිරීමට අවශ්‍යතා සැපයීම.

(ඈ) ක්‍රීඩා කුශලතා ඇති ළමයින් ඵලදායී රක්ෂා වලට යොමු කිරීම.

(ඉ) ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පුහුණුව ආරම්භ කිරීමට උචිතම සුදුසු වයසේදී විද්‍යාත්මක පුහුණුව ලබා දීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

40. අමාත්‍ය වරයා විසින් නියෝග මගින් :- නියෝග

(අ) ක්‍රීඩා ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා තෝරා ගැනීමේ පරිපාටි

(ආ) ප්‍රදානය කරන ක්‍රීඩා ශිෂ්‍යත්වයේ වාර්ෂික වටිනාකම

(ඇ) අවශ්‍ය විය හැකි පරිදි එම කාර්‍ය ඉටු කිරීමට සම්බන්ධීකරණ නිලධාරීන් , කථිකාචාර්යවරුන් , ගුරුවරුන්, උපදේශකයින් සහ වෙනත් නිලධරයන් පත් කිරීම, දීමනා ගෙවීම, සහ ශිෂ්‍යත්වලාභීන්, සඳහා විෂයමාලා පරීක්ෂණ කරන නියම කරනු ලැබිය හැකිය.

41. අමාත්‍ය වරයාට :- පහසුකම් සැපයී[ම] විනය පාලනය ආදිය සඳහා අමාත්‍ය වරයා සතු බලතල.

(අ) ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලද පාසැල් සහ ශිල්පායතනයන්ට පුහුණුව, නේවාසික පහසුකම් හා වෙනත් කාර්‍යයන් සඳහා අවශ්‍ය ගොඩනැගිලි ඉදි කිරීම, ඒවා නඩත්තු කිරීම සහ උපකරණ සම්පාදන කිරීම සඳහා පහසුකම් සැපයීම සඳහා

(ආ) ඒ ශිල්පායතන වල ශිෂ්‍යත්වලාභීන්ගේ සහ ආචාර්‍ය මණ්ඩලයේ විනය සහ සුභ සාධනය ඇති කිරීම සහ විධිමත් කිරීම සඳහා

(ඇ) ඒ ශිල්පායතන වලට ශිෂ්‍යත්වලාභීන් ඇතුළත් කිරීමට විධිවිධාන සැළැස්වීම සඳහා බලය තිබිය යුතුය.

## ක්‍රීඩාංගන ගොඩ නැගීම

42. පුහුණු ක්‍රීඩා කරන, ශාරීරික අධ්‍යාපනය සහ විනෝද ක්‍රීඩා, වෙගස්මත් කිරීම, වැඩි දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා මෙහි මින්මතු "ක්‍රීඩාංගන" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ක්‍රීඩාංගන සංකීර්ණ, ක්‍රීඩා මන්දිර, ක්‍රීඩාපිටි, ක්‍රීඩා කරන ස්ථාන ගොඩ නැංවීම හෝ ගොඩ නංවා ගැනීම අමාත්‍යවරයා විසින් කළ හැකිය. ක්‍රීඩාංගන, ක්‍රීඩා සංකීර්ණ ගොඩ නැගීම.

43. ඒ ගොඩ නැංවීම හෝ ඉදි කිරීම:-
(අ) රජයෙන් ලබා ගන්නාවූ,
(ආ) පළාත් සභා අරමුදලෙන් ලබාගන්නා වූ,
(ඇ) විදේශීය රටවලින් ලැබෙන්නාවූ ආධාර වලින් ලබා ගන්නා වූ,
(ඈ) ලද්දාවූ පරිත්‍යාග වලින් ලබාගන්නා වූ,
(ඉ) වෙනත් ආකාරයකින් ලබාගන්නා වූ මුදල් වලින් කළ හැක.

44. එම ක්‍රීඩාංගන වලට නේවාසික සහ වෙනත් අවශ්‍යතාවයන් සඳහා ගොඩනැගිලි ඉදි කිරීම් හෝ ඉදි කරවා ගැනීම් නඩත්තු හෝ පවත්වා ගැනීම, උපකරණ සජ්ජිත හෝ සජ්ජිත කරවා ගැනීම අමාත්‍යවරයා විසින් කළ යුතුය. ගොඩනැගිලි සජ්ජිත කිරීමට අමාත්‍යවරයා සතු බලතල.

45. අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය.

(අ) එම ක්‍රීඩාංගන වල පරිපාලන සහ වෙනත් කටයුතු සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ පරිපාටිය.

(ආ) එම ක්‍රීඩාංගන වල ඇති පහසුකම් පරිහරණය කිරීම හා ඒ ක්‍රීඩාංගනවල පරිහරණය සඳහා ඇති උපකරණවල ආරක්ෂිත භාවය

## V වන කොටස.

46. (1) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, කමිටුවල, සංවිධානවල සහ වෙනත් මණ්ඩලවල බලතල ක්‍රියාවේ යෙදවීම කාර්යයන් කිරීම සහ යුතුකම් ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය-වරයා විසින් ඒ සභා කමිටු, සංවිධාන හෝ මණ්ඩල වෙත පොදු හෝ විශේෂ ලිඛිත විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, ඒ සභා කමිටු සංවිධාන හෝ වෙනත් මණ්ඩල විසින් ඒ විධාන ක්‍රියාවෙහි යෙදවිය යුතුය. අමාත්‍යවරයා සතු පොදු සහ විශේෂ බලතල.

(2) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, කමිටුවල, සංවිධානවල, හා වෙනත් මණ්ඩලවල දේපළ සහ තටයුතු සම්බන්ධයෙන් වූ වාර්තා ගණන් සහ වෙනත් තොරතුරු තමාට අවශ්‍ය විය හැකි ආකාරයෙන් තමා වෙත සපයන ලෙස අමාත්‍ය වරයා විසින් ඒ සභා වලට, කමිටුවලට, සංවිධානවලට හෝ වෙනත් මණ්ඩල වලට කලින් කල විධාන කළ හැකි අතර, ඒ සභා කමිටු සංවිධාන හෝ වෙනත් මණ්ඩල ඒ සෑම විධානයක් අනුව ක්‍රියා කළ යුතුය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද සභාවල, කමිටුවල, සංවිධානවල සහ වෙනත් මණ්ඩල වල කටයුතු සියල්ලක්ම හෝ ඉන් යමක් තමන් විසින් නිශ්චය කරනු ලැබිය හැකි තැනැත්තෙකු හෝ තැනැත්තන් විසින් විමර්ශණය කර වාර්තා කරන ලෙස අමාත්‍ය වරයා විසින් කලින් කල නියම කළ හැකි අතර, එසේ නියම කරනු ලැබූ කල්හි ඒ ඒ සෑම නියමයක්ම ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය විය හැකි සියලු පහසුකම් සැළැස්වීම් සහ සියලු තොරතුරු සැපයීම් ඒ සභා කමිටු, සංවිධාන, සහ වෙනත් මණ්ඩල, විසින් කළ යුතුය.

47. දක්ෂ පළාත නියෝජනය කරතියි සළකන තනි තනි ක්‍රීඩකයන් හෝ ක්‍රීඩක කණ්ඩායම් ශ්‍රී ලංකාවේදී හෝ විදේශයකදී හෝ ක්‍රීඩා වලට සහභාගිවීම නියෝග මගින් විධිමත් කිරීමද, පාලනය කිරීමද, අමාත්‍ය වරයා විසින් කළ හැකිය.

48. පළාත්පාලන ආයතන, පළාත් පාලන බල මණ්ඩල, සංස්ථාපිත මණ්ඩල හෝ සේවා යෝජිතයෙකු විසින් සැපයිය යුතු අවම ක්‍රීඩා සහ විනෝද ක්‍රීඩා පහසුකම් සම්බන්ධයෙන් අමාත්‍ය වරයා විසින් නියෝග සෑදිය හැකිය.

49. (1) මේ ප්‍රඥප්තිය යටතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහාත් නියමිත සියලු කරුණු සඳහාත්, අමාත්‍ය වරයා විසින් නියෝග සෑදිය හැකිය.

(2) අමාත්‍ය වරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම යෝග්‍ය ආකාරයෙන් පළකළයුතු අතර, එසේ පල කරනු ලබන දින සිට හෝ ඒ නියෝගයෙහි සඳහන් කර තැබිය හැකි පසු දිනක සිට එය ක්‍රියාත්මක විය යුතුය. අමාත්‍ය-වරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම යෝග්‍ය ආකාරයෙන් පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මණින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සැළකිය යුතු නමුදු ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් හානියක් නොවිය යුතුය. අමාත්‍ය වරයා විසින් සාදනු ලැබූ යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැළකෙන දිනය යෝග්‍ය ආකාරයෙන් නිවේදනය කරනු ලැබිය යුතුය.

50. මේ ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලැබූ පළාත් ක්‍රීඩා සභාවේ සාමාජිකයන්ට මුදල් පිළිබඳ විෂය භාර අමාත්‍ය වරයාගේ එකඟත්වය අනුව අමාත්‍ය වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයෙන් සහ ප්‍රමාණයෙන් පරිශ්‍රමික ගෙවනු ලැබිය හැකිය.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පණතෙහි 'අමාත්‍ය වරයා' යනුවෙන් දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය වරයා විසින් ක්‍රීඩා විෂය හෝ කාර්යය පවරනු ලැබූ අමාත්‍ය වරයා අදහස් වන අතර අමාත්‍යාංශය යන්න ඒ අනුව තේරුම් ගත යුතුය. අර්ථ නිරූපනය

' ලේකම්' යනුවෙන් දකුණු පළාත් සභාව විසින් ක්‍රීඩා විෂය හෝ කාර්‍ය්‍ය පවරන ලද අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

''ක්‍රීඩා'' හෝ ක්‍රීඩාව යන්නට අමාත්‍යාංශයේ ලේකම් විසින් මේ පණතේ කාර්‍ය්‍යයන් සඳහා ක්‍රීඩා වශයෙන් පිළිගනු ලැබූ යම් ආකාරයක ක්‍රීඩා, සෙල්ලම්, විනෝද ක්‍රීඩා, ශාරීරික ව්‍යායාම, කාය වර්ධන ව්‍යායාම හා වෙනත් ව්‍යායාම ඇතුළත් වේ.

1990 පෙබරවාරි මස 13 වෙනි දින පවත්වන ලද දකුණු පළාත් සභා රැස්වීමේදී මෙම ප්‍රඥප්තිය ඒකමතිකව සම්මත වූ බව මෙයින් සහතික කරමි.

සභාපති,
දකුණු පළාත් සභාව.

1990 පෙබරවාරි මස 14 වන දින,
ගාල්ලේ '' හිල්ටොප්'' මන්දිරයේ පිහිටි
දකුණු පළාත් සභා කාර්‍ය්‍යාලයේදිය.